# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,544 — 1965 ඔක්තෝබර් 27 වැනි බදාදා — 1965.10.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### අංක 22/65 දරණ ආනයන පාලන දැන්වීම

**1965 බලපත්‍ර ප්‍රයෝජනයට ගැනීම**

තමාගේ 1965 බලපත්‍ර සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු සළස්වා තිබෙන බවට මෙම පාලනයට ඒත්තු ගැන්වීමට ඔවුන්ට හැකි වෙතොත් මිස 1966 ආනයන පංගු මත බලපත්‍ර නිකුත් නොකරන බව සියලුම ආනයනකයින්ට මෙයින් දැනුම් දෙනු ලැබේ. ප්‍රයෝජනයට ගැනීමට අදහස් කර නොමැති දෙවෙනි අර්ධ වර්ෂය සඳහා වූ ප්‍රයෝජනයට නොගත් පංගු කොටස් සහ බලපත්‍ර 1965 නොවැම්බර් 15 වෙනි දිනට මෙම පාලනයට භාරදිය යුතුයි.

2. බලපත්‍ර මත නෞකාගත කිරීමේ අවසාන දිනය වන 1965 දෙසැම්බර් 31 දිනට වෙළඳ පංගු මත නිකුත් කරන ලද ආනයන බලපත්‍ර අවලංගු වන බවද ආනයනකයින්ට මතක් කර දෙනු ලැබේ.

ටී. එම්. විජේනායක,
ආනයන හා අපනයන පාලක.

1965 ඔක්තෝබර් මස 27 දින,
කොළඹ දී.
10–1262


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "රිස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1539——ආර් 9908—6,600 (65/10)